## 2022 පෙබරවාරි මස 15 වන දින පැවති යටිතල පහසුකම්, නිවාස, පුස්තකාල, තොරතුරු තාක්ෂණ හා පුහුණු කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව

**සහභාගිත්වය**

1. ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවීර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. එම්.ඩී.කේ.විනෝදනි විජේසූරිය මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. එම්.එස්.එම්.අල් ෆාරිස් මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. ජී.බී.නුවන් චතුරංග මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. ජයනි රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
6. කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
7. කේ.පී.ඒ.සමතපාල මිය - පුස්තකාලයාධිපති
8. එන්.පී.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
9. ඊ.පී.මදනායක මහතා - ජොෂ්ඨ වැඩ අධිකාරි
10. එම්.ඩී.පී.එච්.දිසානායක මිය - සංවර්ධන නිලධාරි
11. ආර්.එම්.ආර්.ඩී.රාජපක්ෂ මිය - සංවර්ධන නිලධාරි
12. ඩබ්.ඒ.ටී.එම්.වික්‍රමසිංහ මිය - පරිගණක පුහුණු උපදේශක (වැ.බ.)
13. ඩබ්.එම්.බී.වන්නිනායක මහතා - උද්‍යාන වැඩ පරික්ෂක
14. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

**නොපැමිණීම**

1. කේ.පී.සචිනි නිමේෂා මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
2. ජී.ඒ.ශිවන්ත මලික් කුමාර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

1. අනුරාධපුර මහජන පුස්තකාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපතිනිය විසින් "මුද්දර කියවීම" යන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන පිළිබඳ අවධානය යොමු කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නම් උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීම.
   මෙම කාර්ය සම්බන්ධව තැපැල් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු සොයා බලා වාර්තාවක් ඊළඟ කමිටුවට ඉදිරිපත් කිරීමට තීරණය විය. (වගකීම - පුස්තකාලයාධිපතිනිය)

2. සැළසුම් අංශ ප්‍රධානි විසින් යොමු කරන ලද ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය(LDSP) යටතේ ආයතනයේ ධාරිතා සංවර්ධන යටතේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා පහසුකම් සැපයීම පිළිබඳ නිරික්ෂණ වාර්තාව කමිටුවේ දැනගැනීම සඳහා යොමු කිරීම.
   මෙම වාර්තාව කමිටුව විසින් අනුමත කරන ලදී. (වගකීම - සැළසුම් අංශ ප්‍රධානි)

3. කමිටු සභාපති ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවීර මැතිතුමා විසින් පහත සඳහන් යෝජනා ඉදිරිපත් කිරිම.

I. නැණසල පරිගණක මධ්‍යස්ථානය මගින් ලබා දෙන සහතික පත්‍ර සඳහා පිළිගැනිමේ වටිනාකමක් ලබාදීමට අවශ්‍ය කටයුතු කඩිනම් කිරිම.

නැණසල පරිගණක මධ්‍යස්ථානයේ පවතින අඩුපාඩු පිළිබඳ වාර්තාවක් ලබා ගැනිමට තීරණය විය.

II. මහජන පුස්තකාලය සඳහා විශාල අඩුවක් ලෙස පවතින මහජන පුස්තකාල ශ්‍රවනාගාරයක් සහ ඒ සඳහා පැමිණෙන අයවලුන්ගේ පොදු පහසුකම් සපුරා දීමට අවශ්‍ය කටයුතු සැලසීම.

මේ පිළිබඳ ගරු නගරාධිපතිතුමා සහ නාගරික කොමසාරිස්තුමා සමග සාකච්ජා කර තීරණයක් ගැනිම.

III. මහජන පුස්තකාලය ඉදිරිපිට සමාධි බුද්ධ ප්‍රතිමාවක් සහ ආවරණයක් නිර්මාණය කිරිම, මෙහිදී අනුරාධපුර ශ්‍රී විභූතිය ඉස්මතු වන ආකාරයේ නිර්මාණයක් කිරිමටත්, ඒ සඳහා සම්පත් දායකයන් මාර්ගයෙන් අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන ලබා ගැනිමටත් අනුමැතිය ගැනිම.

මහජන පුස්තකාලය ඉදිරිපිට සමාධි බුද්ධ ප්‍රතිමාවක් සහ ඵලකයක් නිර්මාණය කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු /ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි)

IV. මහජන පුස්තකාල භූමියේ ඉදිරිපස මිදුල සහ ගෙවත්ත අලංකාරවත් ලෙස සැකසීමට අවශ්‍ය කටයුතු සැලසීම සඳහා මහා නගර සභාවේ ඍජු දායකත්වය ලබා ගැනිම

දැනට ඉදිරිපත් කර ඇති සැළසුම පිළිබඳ සාකච්ජා කර එහි අඩුපාඩු සකස් කර නව සැළසුමක් ඉදිරිපත් කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

4. කමිටු සභාපති, ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවිර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් අංක 03 හේනවත්ත කොට්ඨාශයේ පහත සඳහන් ගැටළු සඳහා පිළියම් යොදා ගැනිමට කල යෝජනා.

i. නිදහස් මාවත අභය පටුමග ප්‍රදේශයේ වැසි අපජලයෙන් ආපදාවට පත්වන පවුල් කිහිපය සඳහා විසඳුමක් ලබා ගැනිම.

අදාල අපජලය බැසයාම සඳහා සුදුසු ඉඩමකින් අවශ්‍ය ප්‍රමාණය ලබා ගැනිමට ලිපියක් යොමු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

ii. නිදහස් මාවතේ වැසි අපජලය බැසයාමට බාධාවන අයුරින් පිහිටා ඇති බෝක්කු කඩිනමින් යෙදීමට කටයුතු කිරිම.
   a. අභය පටුමග ප්‍රවේශ බෝක්කුව.
   b. නිදහස් පටුමග viii වන පටුමග ප්‍රවේශ බෝක්කුව.
   c. නිදහස් මාවත සිට යසපාල හේරත් මාවත දක්වා වූ මාර්ගයේ නිහදස් මාවත ආරම්භයේ ප්‍රවේශ බෝක්කුව.

මේ ස්ථාන සඳහා බෝක්කු 03 ක් යෙදිමට ඇස්තමේන්තුවක් සකස් කිරිමට තීරණය විය.(වගකීම - නාගරික ඉංජිනේරු)

5. 2021.11.16 දින මෙම කමිටු වාර්තාවේ අංක 08 යටතේ අනුරාධපුර නිවත්තකචේතිය විද්‍යාලයේ සිට යාපනය හන්දිය දක්වා මාර්ගය සහ භික්ෂු විශ්ව විද්‍යාලය, ජර්මන් පාලම හා 2 කණුව වටරවුම අසල මාර්ගය සම්බන්ධ වන ස්ථානයේ විශාල ලෙස වලවල් සෑදී ඇති බැවින් එම මාර්ග පිළිසකර කර දෙන ලෙස දන්වා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යවන ලද ලිපියට සතියක් ඇතුලත පිළිතුරක් නොලැබුන හොත් නැවත සිහිකැඳවිමක් යැවිමට තීරණය කරන ලදි. (වගකීම - නාගරික ඉංජිනේරු)

6. ගරු නාගරික මන්ත්‍රී සුරංගී ආර් සමරතුංග මැතිතුමිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් නගර සභා නිවාස අංක:123, එන්.කුමාර රත්නායක මහතාගේ නිවසේ එක් බිත්තියක් මේවන විට කැඩී ගොස් ඇති බව සඳහන් කර ඇත. වසර 40 ක සිට ප්‍රතිසංස්කරණය නොවූ නගර සභාවට අයත් අපද්‍රව්‍ය බැස යන ප්‍රධාන කාණුව නිසා එය සිදුවී ඇති බැවින් මෙම කමිටුවේ ප්‍රතිපාදන මගින් කාණුව මීටර 100 ක් සකසා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

   මෙම කාර්ය සඳහා කමිටු ප්‍රතිපාදන වෙන් කල නොහැකි බැවින් ඇස්තමේන්තුවක් සකස් කර සහා අරමුදලින් ඉටුකර ගැනිමට තීරණය විය. (වගකීම - නාගරික ඉංජිනේරු)

7. නාගරික මුදල් දෙපාර්තමේන්තුව විසින් නගර සභා නිවාස වාසින්ගේ ස්වේච්ඡා සමිති සහ මහා සභා රැස්වීම සඳහා අංක 01 ප්‍රජා ශාලාව දක්වා ඇති දිනයන් හා වේලාවන් වෙන් කර ගැනිමට යොමු කරන ලද ලිපිය කමිටුව විසින් අනුමත කරන ලදි. (වගකීම - නාගරික ගණකාධිකාරි)

8. ගරු නාගරික මන්ත්‍රී පී.බී.නුවන් චතුරංග මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින්,

   i. 257,3 වන පියවර, 3 වන කොටසෙහි අංක:3185/38,සෙනවිරත්න මහතාගේ නිවසේ සිට අංක:3185/32,ලීලාවති මහත්මියගේ නිවස දක්වා 200m පමණ වූ අතුරු මාර්ගය තාර දමා සංවර්ධනය කරන ලෙසත්,

   ii. 257,පුබුදුපුර,අංක:23,එල්.මහින්ද මහතාගේ නිවසේ සිට අංක:76,ආර්.එම්.එම්.ප්‍රේමරත්න මහතාගේ නිවස දක්වා ඇති 200m පමණ වූ අතුරු මාර්ගය තාර දමා සංවර්ධනය කරන ලෙසත් කර ඇති ඉල්ලීම.

කාපට් අතුරා මාර්ග සංවර්ධනය කිරිමට මෙම මාර්ග 02 ක යෝජනාවී ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලැබී ඇති ද යන්න මාර්ග සංවර්ධන අධිකාරිය විමසීම් කර තීරණයක් ලබා ගැනිමට තීරණ විය. (වගකීම - නාගරික ඉංජිනේරු)

9. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.සුපිනි සඳමාලි මැතිතුමිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 250 නුවර වැව ග්‍රාම නිලධාරි තුලානේ තොළුවිල වත්ත (ඩී පාර්ක් හෝටලය දෙසට ඇති මාවත) පදිංචි අය සඳහා පානිය ජල සැපයුම ලබා දෙන මෙන් කර ඇති ඉල්ලීම.
ඇස්තමේන්තු කර කොට්ඨාශ ප්‍රතිපාදන යටතේ ඉටුකිරිමට තීරණය කිරිම. (වගකීම - නාගරික ඉංජිනේරු)

10. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩී.කේ.විනෝදනි විජේසූරිය මැතිතුමිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් අංක 01 පැතිස්පුර කොට්ඨාශයේ පහත සඳහන් මාර්ගවල වලවල් සෑදී අබලන් තත්ත්වයේ පවතින බැවින් බොරළු යොදා සකස් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.

I. මහින්ද පිරිවන අසල සිට මල්වතු පටුමග මාර්ගයේ කොටස.
II. තිසරණ මාවත.
III. කුට්ටම් පොකුණ සුසන්ත මහතාගේ නිවස අසල මාර්ගය.
IV. සාරිපුත්ත ආශ්‍රමය ඇල පාර.
V. විනය වර්ධන මාර්ගය.

මෙම මාර්ග පිළිබඳව සොයා බලා ඇස්තමේන්තු කිරිමට තීරණය විය. (වගකීම - නාගරික ඉංජිනේරු)

ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවිර,
නාගරික මන්ත්‍රී /කමිටු සභාපති,
යටිතල පහසුකම්, නිවාස, පුස්තකාල
තොරතුරු තාක්ෂණ හා පුහුණු කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව,
මහා නගර සභාව
අනුරාධපුර